## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## බස්නාහිර පළාතේ
## පළාත් සභාව

(සෞඛ්‍ය සහ ආර්ථික උපවුහයන් පිළිබඳ අමාත්‍යාංශය)

# 1989 අංක 04 දරන පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

## ප්‍රඥප්තිය

(බස්නාහිර පළාත)

මෙහි අංක 01 සිට 18 දක්වා ඡේදයන් ඇතුළත්වන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය නම් වූ මෙම ප්‍රඥප්තිය 1989 සැප්තැම්බර් මස 27 වන දින පවත්වන ලද බස්නාහිර පළාත් සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව සහතික කරමි.

සභාපති,
බස්නාහිර පළාත් සභාව.

CM 11076 - 100 (2009/10)

(ii) මුදල් විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ පළාත්සභා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්

(iii) 1981 අංක 73 දරන මගී සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙක්

(iv) රජයේ නගර නිර්මාණ ශිල්පී හෝ ඔහු විසින් නම් කරන ලද. නගර හා ග්‍රාම නිර්මාන දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු,

යනුවෙන් විය යුතු වෙනත් සාමාජිකයන් හතර දෙනෙක්.

(2) පත් කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු මහාමාර්ග විෂයය භාර පළාත් සභා අමාත්‍යවරයා විසින්, පළාත්බද අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ.

(3) පළාත් සභා මන්ත්‍රීවරයකුවන හෝ පළාත්සභා මන්ත්‍රීවරයකු බවට පත්වන තැනැත්තෙක්, පළාත්සභා අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(4) යම් තැනැත්තකු පළාත්බද අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙර, පළාත්බද අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා විසින් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති කිසිදු මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට, පළාත්සභා අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතුය. තවද පළාත්බද අධිකාරියේ කිසිම සාමාජිකයකුට එවැනි කිසිම සම්බන්ධතාවක් නොමැති බවට පළාත්සභා අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත්විය යුතුය. මේ උපවගන්තිය යටතේ සිය කාර්ය තමා විසින් ඉටුකරනු ලැබීම සඳහා අවශ්‍යයැයි පළාත්සභා අමාත්‍යවරයා සලකන තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවරවිටක, ඒ තොරතුරු, පළාත්බද අධිකාරියේ සාමාජිකයකු ලෙස අමාත්‍යවරයා විසින් පත්කරන ලද යම් තැනැත්තකු විසින් හෝ ඒ අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට ඒ අමාත්‍යවරයා අදහස් කර සිටින යම් තැනැත්තකු විසින් හෝ ඒ අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(5) පළාත්බද අධිකාරිය විසින් ඇතිකර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව, කෙළින්ම හෝ අන් අයුරකින් කිසියම් සම්බන්ධතාවක් ඇති පළාත්බද අධිකාරියේ යම් සාමාජිකයකු විසින්, ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය පළාත්බද අධිකාරියේ රැස්වීමක දී හෙළිදරව් කරනු ලැබිය යුතු අතර ඒ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතු ය. තව ද පළාත්බද අධිකාරිය විසින් ඒ ගිවිසුම සලකා බැලීමේ දී හෝ ඒ පිළිබඳව තීරණයකට එළඹීමේ දී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

# බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතට අනනුකූල ප්‍රඥප්තියකි.

පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ අධිකාරියේ බලතල කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කොට දැක්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1989 අංක 04 දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් පළාත් සභා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය. — කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

## 1 වන කොටස

### බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2. (1) මෙහි මින් මතු "පළාත්බද අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන, බස්නාහිර පළාතේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන පළාත්බද අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. — පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියක් පිහිටුවීම.

(2) පළාත්බද අධිකාරිය, (1) වන උපවගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තවද ඒ නාමයෙන් එය විසින් නඩු පවරනු ලැබිය හැකි අතර එයට විරුද්ධව ද ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

(3) පළාත්බද අධිකාරිය විසින්, මහා මාර්ග විෂය භාර පළාත් සභා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

3 (1) පළාත්බද අධිකාරිය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. — පළාත් බද අධිකාරියේ සාමාජිකයෝ

*(අ)* සිවිල් ඉංජිනේරු විද්‍යාව, මහාමාර්ග ඉංජිනේරු විද්‍යාව, වාණිජ්‍යය, මූල්‍යය හෝ පරිපාලනය පිළිබඳ පුළුල් පළපුරුද්දක් හා නිපුණත්වයක් දක්වා ඇතැයි පළාත් සභාවේ මහාමාර්ග විෂයයභාර අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් ඒ අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තුන් දෙනෙක්.

*(ආ)* (i) මහාමාර්ග විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන, ඒ පළාත්සභා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්

(6) පළාත්බද අධිකාරියේ පත් කළ සෑම සාමාජිකයකුම, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට ගණන් ගැනෙන හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ පළාත්සභා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ධූරය දැරිය යුතු අතර, (8) වන උපවගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(7) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, පළාත්බද අධිකාරියේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේ ය.

(8) කවර හෝ පත් කළ සාමාජිකයකු කිසි හේතුවක් නොදක්වා, පළාත් සභා අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසි අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(9) පළාත්බද අධිකාරියේ සාමාජිකයකු සම්බන්ධයෙන්, පළාත්සභා අමාත්‍යවරයා විසින් (8) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති විට, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේදී ඒ සාමාජිකයා, ඔහුගේ ධූරය හිස් කළ යුතු ය.

(10) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන්, පළාත්බද අධිකාරියේ පත් කළ සාමාජිකයකුට, සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධූරයෙන් ඕනෑම අවස්ථාවකදී, ඉල්ලා අස්විය හැකි ය.

(11) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ පළාත්බද අධිකාරියේ යම් සාමාජිකයකු ස්වකීය ධූරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක-

(අ) ඔහු පත් කළ සාමාජිකයෙකු නම්, (1) (අ) උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, පළාත්සභාවේ අමාත්‍යවරයා විසින්, වෙනත් තැනැත්තකු , ඒ සාමාජිකයා වෙනුවට වැඩබැලීම සඳහා පත්කළ හැකිය ; නැතහොත්

(ආ) ඔහු 1 වන උපවගන්තියේ (අ) ඡේදයේ (I) සිට (II) දක්වා වූ අනුඡේද යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකු නම්, ඒ සාමාජිකයා නම් කළ පළාත්සභාවේ අමාත්‍යවරයා විසින්, වෙනත් තැනැත්තකු, ඒ සාමාජිකයා වෙනුවට වැඩබැලීම සඳහා නම් කළ හැකි ය.

(12) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ පළාත්බද අධිකාරියේ සභාපතිවරයා ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක, වෙනත් යම් පත්

(6) පළාත්බද අධිකාරියේ පත් කළ සෑම සාමාජිකයකුම, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට ගණන් ගැනෙන හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ පළාත්සභා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ධූරය දැරිය යුතු අතර, (8) වන උපවගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(7) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, පළාත්බද අධිකාරියේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේ ය.

(8) කවර හෝ පත් කළ සාමාජිකයකු කිසි හේතුවක් නොදක්වා, පළාත් සභා අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසි අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(9) පළාත්බද අධිකාරියේ සාමාජිකයකු සම්බන්ධයෙන්, පළාත්සභා අමාත්‍යවරයා විසින් (8) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති විට, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේදී ඒ සාමාජිකයා, ඔහුගේ ධූරය හිස් කළ යුතු ය.

(10) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන්, පළාත්බද අධිකාරියේ පත් කළ සාමාජිකයකුට, සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධූරයෙන් ඕනෑම අවස්ථාවකදී, ඉල්ලා අස්විය හැකි ය.

(11) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ පළාත්බද අධිකාරියේ යම් සාමාජිකයකු ස්වකීය ධූරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක-

(අ) ඔහු පත් කළ සාමාජිකයෙකු නම්, (1) (අ) උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, පළාත්සභාවේ අමාත්‍යවරයා විසින්, වෙනත් තැනැත්තකු , ඒ සාමාජිකයා වෙනුවට වැඩබැලීම සඳහා පත්කළ හැකිය ; නැතහොත්

(ආ) ඔහු 1 වන උපවගන්තියේ (අ) ඡේදයේ (I) සිට (II) දක්වා වූ අනුඡේද යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකු නම්, ඒ සාමාජිකයා නම් කළ පළාත්සභාවේ අමාත්‍යවරයා විසින්, වෙනත් තැනැත්තකු, ඒ සාමාජිකයා වෙනුවට වැඩබැලීම සඳහා නම් කළ හැකි ය.

(12) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ පළාත්බද අධිකාරියේ සභාපතිවරයා ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක, වෙනත් යම් පත්

කළ සාමාජිකයකු, සභාපතිවරයා ලෙස වැඩ බැලීම සඳහා පළාත් සභාවේ අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

(13) පළාත්බද අධිකාරියේ සියලුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවකුට මුදල් විෂයය භාර පළාත් සභා අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිශ්‍රමික, දීමනා සහ වෙනත් වියදම්, පළාත්බද අධිකාරියේ අරමුදලින් ගෙවනු ලබිය හැකි ය.

පළාත්බද අධිකාරියේ කාර්ය පටිපාටිය

4. (1) පළාත්බද අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටීනම්, අධිකාරියේ සෑම රැස්වීමකම මූලාසනය, ඔහු විසින් දැරිය යුතුය. පළාත්බද අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(2) පළාත්බද අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන සෑම වූ හෝ අවස්ථාවක එය රැස්විය යුතු ය.

(3) පළාත්බද අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) පළාත්බද අධිකාරියේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතු ය.

(5) පළාත්බද අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබියදී වුවද අධිකාරියට ක්‍රියා කළ හැකිය. පළාත්බද අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවන අතර නිර්බල සේ සලකනු නොලැබිය යුතු ය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, පළාත්බද අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා ඒ අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

පළාත්බද අධිකාරියේ මුද්‍රාව.

5. (1) පළාත්බද අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(2) පළාත්බද අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) එක් අයකු පළාත්බද අධිකාරියේ සභාපතිවරයා වන්නා වූ පළාත්බද අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබනු නො ලැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

## II වන කොටස

### මාර්ග සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ පළාත්බද අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය

පළාත්සභා අමාත්‍යවරයාගේ නියමයක් මගින් මාර්ග සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම හා ඒ නියමවල බලපෑම.

6 (1) ප්‍රාදේශික අවශ්‍යතාවල සහ ක්‍රම සම්පාදනයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගන්නා විට බස්නාහිර පළාත ඇතුළත යම් ප්‍රදේශයක මාර්ග සංවර්ධනය විධිමත් කිරීම හා පාලනය කිරීම අවස්ථාවෝචිත යයි පළාත්සභා අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඒ ප්‍රදේශය (මෙහි මින්මතු "සංවර්ධන ප්‍රදේශයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග සංවර්ධන ප්‍රදේශයක් විය යුතු බවට ඔහු විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කෙරෙන (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් ඒ ප්‍රදේශයේ සීමා හා මායිම් සලකුණු කොට ඒ ප්‍රදේශය වෙන් කර දැක්විය යුතු ය.

(3) සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත්කරනු ලැබූ විට, පළාත්බද අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව හැර, ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක් මගින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ජාතික මහාමාර්ගවල නැතහොත් ජාතික මහාමාර්ගයන්හි ඇති පාලම් සහ තොටුපලවල සංවර්ධන වැඩ නොවන කිසිදු මාර්ග සංවර්ධන වැඩක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරනු ලැබීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

පළාත්බද අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

7. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත -

(අ) මහාමාර්ග විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා විසින් කලින් කල පළාත්බද අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව ඒ ප්‍රදේශ ඇතුළත අනුකලනය කළ මාර්ග සැලසුම් කිරීම හා මාර්ග සංවර්ධනය කරගෙන යාම ;

(ආ) පළාත්සභා අමාත්‍යවරයා විසින් කලින් කල පළාත්බද අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව, ඒ ප්‍රදේශවල අනුකලනය කළ මාර්ග සැලසුම් කිරීම හා අනුකූල වූ ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධන වැඩ, ක්‍රියාකාරකම් හා සේවාවන් හා සම්බන්ධිත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මූලධන ආයෝජන සැලසුම් ඇතුළුව මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම හා මහාමාර්ග විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඈ) යම් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට මහාමාර්ග විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව කෙළින්ම හෝ ශ්‍රී ලංකාව තුළ නැතහොත් ඉන් පිටත යම්

තැනැත්තකු සමඟ හවුල් ව්‍යාපාරයක ස්වරූපයෙන් හෝ ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හා කරගෙන යාම ;

(ඉ) යම් අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් නිමකිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු විසින් පැහැර හරින ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය නිම කිරීමට භාර ගැනීම ;

(ඊ) මහාමාර්ග විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ මාර්ග සංවර්ධන සැලසුම් හා මූලධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම ;

(උ) පළාත ඇතුළත ප්‍රධාන මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් සම්පාදනය කිරීම ;

(ඌ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හෝ දැරීම නැතහොත් එය විසින් අත්කර ගනු ලැබූ හෝ දැරූ යම් චංචල හෝ නිශ්චල දේපළක් බැහැර කිරීම ;

(එ) ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක ඉල්ලීම අනුව, ඒ නියෝජිතායතනය වෙනුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම පිළියෙල කිරීම සහ ඒ ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම හෝ ඊට සහාය වීම.

(ඒ) ඒ ප්‍රදේශවල ආණ්ඩුවේ නියෝජිතායතනවල හෝ වෙනත් තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග සැළසුම් සේවා සැපයීම ;

(ඔ) පළාත්බද අධිකාරිය විසින් සපයනු ලබන කවර වූ හෝ සේවාවන් සඳහා ගාස්තු අය කිරීම ;

(ඕ) මුදලින් හෝ අන්‍යාකාරයෙන් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් භාර ගැනීම සහ පළාත්බද අධිකාරියේ අරමුණු අතුරෙන් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒවා උපයෝගී කිරීම ; සහ

(ක) මේ ප්‍රඥප්තිය යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් ප්‍රසාංගික හෝ ආනුෂංගික වන්නා වූ සියලු ක්‍රියා හෝ දේවල් කිරීම

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩ සටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට, යෝජිත වැඩ කටයුතුවලින් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අයිතිවාසිකම් සම්බන්ධයෙන්

හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිවේ ද අවස්ථාවෝචිත පරිදි, ඒ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව විමසා ඒවා සකස් කිරීම හෝ ක්‍රියාත්මක කිරීම පළාත්බද අධිකාරියේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට යම් පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක් ඒ සංවර්ධන ප්‍රදේශයට ඇතුළත් වන්නේ නම් හෝ අතිව්‍යාප්ත වන්නේ නම්, පළාත්බද අධිකාරියේ ඒ සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ රැස්වීමට හෝ රැස්වීම්වලට පැමිණ සහභාගිවන ලෙස, ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාට හෝ සභාපතිවරයාට සහ අවස්ථාවෝචිත පරිදි, ඒ නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ පළාත් පාලන ආයතනයේ නිලධරයකුට ආරාධනා කිරීම, පළාත්බද අධිකාරියේ කාර්යය වන්නේ ය.

8. (1) පළාත්බද අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පිළිබඳව පළාත්සභා අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය. පළාත්සභා අමාත්‍යවරයාගේ විධාන.

(2) පළාත්බද අධිකාරියේ දේපළ සහ කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස පළාත්සභා අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කල ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, පළාත්බද අධිකාරිය විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

9. මේ ප්‍රඥප්තිය යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් පළාත්බද අධිකාරය විසින් අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් නිලධරයකුට ලියවිල්ලකින් පැවරිය හැකි ය. පළාත්බද අධිකාරිය විසින් බලතල ආදිය පැවරීම.

## III වන කොටස

### පළාත්බද අධිකාරියේ කාර්ය මණ්ඩලය

10. (1) පළාත්බද අධිකාරිය විසින්, පළාත්සභා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයකු පත් කරනු ලැබිය යුතු ය. පළාත්බද අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා

(2) පළාත්බද අධිකාරියේ වැඩ කටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ද අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය ද, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අධිකාරියේ සාමාන්‍ය විධානයට යටත්ව, සාමාන්‍යාධිකාරිවරයාට භාර කරනු ලැබිය යුතු ය.

(3) තමාගේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් පළාත්බද අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යැයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය, පළාත්බද අධිකාරියේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, සාමාන්‍යාධිකාරිවරයා විසින් ලියවිල්ලකින්, ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතු ය.

(4) මහා මාර්ග විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සමාන්‍යාධිකාරිවරයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

පළාත්බද අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය.

11. (1) (පළාත්~~සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්~~) පළාත්බද අධිකාරිය විමසා මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට යටත්ව -

(අ) පළාත්බද අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කාර්ය මණ්ඩලයක් පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යාම ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි තීරණය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම ; කළ හැකි ය.

(2) පළාත්බද අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ ද එම නිලධරයා සේවයේ නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද රාජ්‍ය පරිපාලනය ; පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව පළාත්බද අධිකාරිය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පළාත්බද අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු පළාත්බද අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා පළාත්බද අධිකාරියට සේවය කරන යම් සේවා කලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුව කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතු ය.

## IV වන කොටස

### මුදල්

12. (1) පළාත්බද අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු ය. පළාත්බද අධිකාරියේ අරමුදල

(2) පළාත්බද අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතු ය.

(අ) පළාත්බද අධිකාරියේ ප්‍රයෝජනය සඳහා කලින් කල බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී පළාත්බද අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල් ;

(3) මේ ප්‍රඥප්තිය සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පළාත්බද අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, පළාත්බද අධිකාරියේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම, අධිකාරියේ සාමාජිකයන්ට හා අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීම පළාත්බද අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් දරනු ලබන යම් වියදම් ගෙවීමේ කාර්යය සඳහා සහ, කලින් කල අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්ය සඳහා, පළාත්බද අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් උපයෝගී කර ගත හැකි ය.

(4) පළාත්බද අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂයක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධනයේ මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා විසින් පළාත්සභා අමාත්‍යවරයා විමසා තීරණය කරන වාරික වලින් පළාත්සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ මුදල් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට බැර කළ යුතු ය.

13. මේ ප්‍රඥප්තිය යටතේ පළාත්බද අධිකාරියේ කාර්ය ඉටු කිරීමේ දී සිය වගකීම් ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල් පළාත්සභා අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකි ය. පළාත්බද අධිකාරියේ ණයගැනීමේ බලතල.

එසේ වුවද, පළාත්බද අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් තාවකාලික ණය මුදල් වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුළු මුදල, කිසිම අවස්ථාවකදී, මුදල් විෂයය භාර පළාත්සභා අමාත්‍යවරයා විමසා පළාත්සභා අමාත්‍යවරයා විසින් නිශ්චය කරන මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

14. (1) පළාත්බද අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය. පළාත්බද අධිකාරියේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

(2) පළාත්බද අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතු ය.